# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020
# පාසල් පාදක තක්සේරුකරණය යටතේ (50) නාට්‍ය හා රංග කලාව විෂයයට අදාළ
# 11 ශ්‍රේණියේ අවසන් තක්සේරුකරණය

2020 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත, 11 ශ්‍රේණියේ දෙවන පාසල් පාදක තක්සේරුකරණය පිළිබඳ මූලික තොරතුරු පහත පරිදි වේ.

- මෙහි ක්‍රියාකාරකම් A සහ B යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.
  - A කොටස - සාමූහික ක්‍රියාකාරකම්
  - B කොටස - කේවල ක්‍රියාකාරකම්

| කොටස | ක්‍රියාකාරකම | කේවල / සමූහ බව | කාලය විනාඩි | නිර්ණායක සංඛ්‍යාව | ලකුණු |
|---|---|---|---|---|---|
| A කොටස | කෙටි නාට්‍ය නිර්මාණයක් **හෝ** කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම | සමූහ | 08 | 04 | 20 |
| | නිර්මාණාත්මක රංග රචනය | කේවල | 04 | 04 | 20 |
| B කොටස | පෙළ ආශ්‍රිත භාෂණ රංගනය | කේවල | 04 | 04 | 20 |
| | නාට්‍ය ගීතය | කේවල | 03 | 04 | 20 |
| | ක්ෂණික නිරූපණය | සමූහ | 03 | 04 | 20 |
| | **එකතුව** | | **22** | **20** | **100** |

- ඉහත ක්‍රියාකාරකම් සියල්ල ම 2008 වර්ෂයේ පටන් 2019 වර්ෂය දක්වා සාමාන්‍ය පෙළ විභාගයේ නාට්‍ය හා රංග කලාව ප්‍රායෝගික පරීක්ෂණ මූලාකෘති දෙකෙහි භාවිත ක්‍රියාකාරකම් වන අතර 2020 වර්ෂයේ 11 ශ්‍රේණියේ දෙවන පාසල් පාදක තක්සේරුකරණය ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගළපා ඉදිරිපත් කිරීමකි.
- සෑම සිසුවෙකු හෝ සිසුවියක ම ඉහත A සහ B යන කොටස් දෙකටම ඉදිරිපත් විය යුතු අතර සිසු සිසුවියන් කණ්ඩායම් කිරීමේ දී පංති කාමර නාම ලේඛනයේ අනුපිළිවෙල අනුව සිදු කළ යුතු ය. කණ්ඩායමක සිසු සිසුවියන් 5ත් 8ත් අතර සංඛ්‍යාවක් සිටිය යුතු ය.
- මෙම ක්‍රියාකාරකම් සඳහා ඉදිරිපත් වීමේ දී පුහුණු ඇඳුම් කට්ටලයක් භාවිත කළ යුතු වේ.
- ඉහත A කොටසට අයත් නිර්මාණාත්මක රංග රචනය පිළිබඳ ක්‍රියාකාරකම සඳහා 2016 වර්ෂයේ පටන් 2019 වර්ෂය දක්වා අ.පො.ස (සා/පෙළ) විභාගයේ නිර්මාණාත්මක රංග රචන ක්‍රියාකාරකම සඳහා භාවිත කළ සංගීත ඛණ්ඩ අනුව හෝ මෙම ක්‍රියාකාරකම සඳහා යෝග්‍යයැයි සිසුන් හෝ ගුරු භවතුන් විසින් ම තෝරා ගන්නා ලද සංගීත ඛණ්ඩ අනුව පුහුණුවිය හැකි ය.
- B කොටසට අයත් පෙළ ආශ්‍රිත භාෂණ රංගනය පිළිබඳ ක්‍රියාකාරකම සඳහා භාවිතා කළ යුත්තේ 10 සහ 11 ශ්‍රේණි සඳහා නිර්දිෂ්ට නාට්‍ය කෘති ය.
- මෙම තක්සේරුකරණ සඳහා භාවිත කරන සෑම නිර්ණායකයකට ම ලකුණු 1ක අවම සාධන මට්ටමක සිට ලකුණු 5ක් ප්‍රදානය කෙරෙන උපරිම සාධන මට්ටමක් දක්වා වන ලකුණු පරිමාණයක් අනුව ලකුණු ප්‍රදානය කෙරේ. එම ලකුණු පරිමාණය අනුව මෙම නිර්ණායක 20 සඳහා ම අපේක්ෂිත සාධන මට්ටම් 100ක් නිශ්චිත ව හඳුනාගෙන පෙළ ගස්වා ඇත.
- මෙම අපේක්ෂිත සාධන මට්ටම් සිසු දරු දැරියන් තක්සේරුකරණයට පමණක් නොව ඔවුන් පුහුණු කිරීම සඳහා ද ගුරුභවතුන්ට ප්‍රමිතියක් හා මග පෙන්වීමක් වේ.
- යම් නිර්ණායකයකට අදාළ ව ලකුණු ප්‍රදානයේ දී උපරිම සාධන මට්ටමේ සිට අවම සාධන මට්ටම දක්වා වන පොදු ප්‍රමිති පහත දැක්වේ.

| ලකුණ | ප්‍රමිතිය | විස්තරය |
|---|---|---|
| 5 | **විශිෂ්ට යි** | ගුණාත්මක බවින් ඉතා විශිෂ්ට මට්ටමේ ඉදිරිපත් කිරීමකි. |
| 4 | **ඉතා හොඳ යි** | ගුණාත්මක බවින් ඉහළ ඉදිරිපත් කිරීමක අවශ්‍ය වන්නේ යම් යම් සංවර්ධන කිහිපයක් පමණි. |
| 3 | **හොඳ යි** | මූලික ශිල්පීය අවශ්‍යතාවන් හා ප්‍රමිතීන් සපුරා තවදුරටත් සංවර්ධනය කළ හැකි ශිල්පීය හා නිර්මාණාත්මක විභව විශද කරවයි. |
| 2 | **සංවර්ධනය කළ යුතු යි** | අපේක්ෂිත ප්‍රමිතියට ළඟා වී නැත. පුහුණුව අවශ්‍ය ය. සූදානම ප්‍රමාණවත් නැත. මූලික මට්ටමේ ඉදිරිපත් කිරීමකි. ගුණාත්මක ව පෝෂණය වී නැති විටෙක ඇගැයීම් මණ්ඩලයේ යම් සහායන් මත ඉදිරිපත් කිරීම් සිදු කරයි. |
| 1 | **වඩාත් සංවර්ධනය කළ යුතු යි** | දරුවාගේ සූදානම මඳ ය. පරීක්ෂණය පිළිබඳ අවබෝධයක් නැත. විටෙක පරීක්ෂණ මණ්ඩලයේ ද සහායෙන් යම් ඉදිරිපත් කිරීම් සිදු කරයි. |

**පරීක්ෂක මණ්ඩලය**

- පරීක්ෂක මණ්ඩලයක සාමාජිකයන් 3කි.

  ප්‍රධාන පරීක්ෂක - අදාළ කලාපයේ නාට්‍ය හා රංග කලාව (සිංහල) විෂය සම්බන්ධව අත්දැකීම් සහිත විෂය අධ්‍යක්ෂකවරයෙක්/ ගුරු උපදේශකවරයෙක්/10 - 11 ශ්‍රේණිවල නාට්‍ය හා රංග කලාව (සිංහල) විෂය ඉගැන්වීමෙහි නිරතවන අත්දැකීම් සහිත ගුරුවරයෙක්

  පරීක්ෂක 01 - අදාළ කලාපයේ 10 - 11 ශ්‍රේණිවල නාට්‍ය හා රංග කලාව (සිංහල) විෂය ඉගැන්වීමෙහි නිරතවන අත්දැකීම් සහිත ගුරුවරයෙක්

  පරීක්ෂක 02 - පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන සිසුන්ට නාට්‍ය හා රංග කලාව (සිංහල) විෂය උගන්වන ගුරුවරයා

- තීරණය කර ගත් ලකුණු සටහන් කිරීම සඳහා පත්‍ර 3කි.

**1 විස්තරාත්මක ලකුණු සටහන් පත්‍රය**

- එක් අපේක්ෂකයෙකුට එක් විස්තරාත්මක ලකුණු ලැයිස්තුව බැගින් භාවිතා කළ යුතු වේ.
- සෑම ක්‍රියාකාරකමක් සඳහා ම ඒ ඒ නිර්ණායක යටතේ ලබා ගත් ලකුණු කවයකින් සටහන් කිරීම අවශ්‍ය වේ.
- එම නිර්ණායක සඳහා ලබා ගත් ලකුණුවල එකතුව දකුණු පස ඇති කොටුව තුළ සඳහන් කළ යුතු ය.
- B 1 ක්‍රියාකාරකම සඳහා ලකුණු සටහන් කිරීමේදී B 1 - i සහ B 1 - ii ක්‍රියාකාරකම්වලට අදාළ මුළු ලකුණුවල එකතුව 2න් බෙදා වටයා සටහන් කළ යුතු ය.
- ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ලකුණුවල එකතුව 100න් ලකුණක් ලෙස සටහන් කර නිවැරදි බවට පරීක්ෂක මණ්ඩලයේ සියලු දෙනා තහවුරු කළ යුතු ය.

**2 සංක්ෂිප්ත ලකුණු සටහන් පත්‍රය**

- දෛනිකව එක් සංක්ෂිප්ත ලකුණු ලැයිස්තුවක් භාවිතා කළ යුතු ය.
- එක් එක් අපේක්ෂකයා ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ලකුණු වෙන වෙන ම ඇතුළත් කර මුළු ලකුණු ද ඇතුළත් කළ යුතු ය.
- පරීක්ෂක මණ්ඩලයේ සියලු ම දෙනා ලකුණුවල නිරවද්‍යතාව තහවුරු කළ යුතු වේ.

**3 පරිගණක මුද්‍රිත අවසන් ලකුණු ලැයිස්තුව**

- සංක්ෂිප්ත ලකුණු ලැයිස්තුවට අනුව අපේක්ෂකයා ක්‍රියාකාරකම් සඳහා ලබාගත් මුළු ලකුණු ඉලක්කමෙන් සහ අකුරෙන් ඇතුළත් කළ යුතු ය.

- පරීක්ෂක මණ්ඩලයේ සියලු දෙනා ඉහත ලකුණු ලැයිස්තු තුනෙහි ලකුණු සංසන්දනය කර බලා නිවැරදි බව තහවුරු කර ගැනීම අවශ්‍ය වේ.

## A 1-i. කෙටි නාට්‍ය නිෂ්පාදනය - (සාමූහික)

විනාඩි 05-08 ත් අතර කාල පරාසයකින් රඟ දැක්විය හැකි නාට්‍ය පෙළක් රචනා කර ශිෂ්‍ය කණ්ඩායමක් ලෙස රඟ දැක්වීම්

සිසු සිසුවියන් 06ක සංඛ්‍යාවකින් සමන්විත විය යුතු කණ්ඩායම් පරීක්ෂණයකී පිටපතේ සිට රඟ දැක්වීම දක්වා නාට්‍ය නිෂ්පාදන ක්‍රියාවලිය අනුව සැකසුණු නිර්මාණයක් විය යුතු ය. රංග භාණ්ඩ රංග වස්ත්‍ර ආදිය සහ සංගීත නිර්මාණයන් හා වාදනයන් පමණක් භාවිත කිරීමට ඉඩ තිබේ ස්ථානීය වශයෙන් භාවිත කළ හැකි මේසයක් පුටුවක් වැනි සරල සහ අත්‍යවශ්‍ය ම පසුතල පමණක් භාවිත කිරීමට ඉඩ ලැබේ. විනාඩි 10 ඉක්මවීමෙන් පසු අගැයීම් මණ්ඩලය විසින් නාට්‍යය නතර කරනු ලැබේ.

**ලකුණු** 20 ( **විනාඩි** 08)

**නිර්ණායක (සෑම නිර්ණායකයක් යටතේ ම උපරිම ලකුණු 05ක් ප්‍රදානය කෙරේ)**

1. නාට්‍ය පිටපතඃ සිදුවීම් ( අවස්ථාවන් චරිත හා සංවාද )
2. ශාරීරික ප්‍රකාශනය සහ අවකාශ භාවිතය
3. සරල පසුතල, අංග රචනය සහ සංගීත/හඬ' භාවිතය/නාට්‍යෝපකරණ , වේෂභූෂණ
4. කණ්ඩායමික සාමූහිකත්වය හා සූදානම

## A 1-ii කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම - (සමූහ)

කණ්ඩායම කැමති ඕනෑම සාම්ප්‍රදායික කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කළ යුතු යි මෙම ඉදිරිපත් කිරීම විනාඩි 05ත් 08ත් අතර කාලයක දී සිදු කළ යුතු ය.

තෝරාගන්නා කතාවක එහි චරිත අවස්ථාවන් නාට්‍යානුසාරීව නිරූපණය වන ආකාරයට රංගනයෙන් ඉදිරිපත් කළ යුතු ය. **දෙස් විදෙස් ජන කතාවක සුරංගනා කතාවක උපමා කතාවක් හෝ වෙනත් සුදුසු කතාවක් තෝරාගැනීමට නිදහස තිබේ** නාට්‍යෝපකරණ , වේෂභූෂණ ආදිය භාවිත කිරීමට ඉඩ ඇති අතර ස්ථානීය වශයෙන් භාවිත කළ හැකි මේසයක් පුටුවක් වැනි සරල සහ අත්‍යවශ්‍ය ම පසුතල පමණක් භාවිත කිරීමට ඉඩ ලබා දේ. සිසුවා හෝ සිසුවිය ට පමණක් හැසිරවිය හැකි ආකාරයේ සංගීත/ශබ්ද සංයෝජනයන්ට වුව ද ඉඩ ඇති මෙහි දී රූකඩ වුව ද භාවිත කිරීමට නිදහස තිබේ.

**ලකුණු** 20 ( **විනාඩි** 08)

**නිර්ණායක (සෑම නිර්ණායකයක් යටතේ ම උපරිම ලකුණු 05ක් ප්‍රදානය කෙරේ)**

1. කතන්දරය තෝරාගැනීම හා ඒ පිළිබඳ මනා අවබෝධය
2. කටහඬ හඬ ප්‍රක්ෂේපණය උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම
3. ශාරීරික ප්‍රකාශනය රංග උපක්‍රම සහ අවකාශ භාවිතය
4. කණ්ඩාමික සාමුහිකත්වය හා සූදානම

## A 2. නිර්මාණාත්මක රංග රචනය (Choreography) - (සමූහ)

පන්ති කාමර ඇගැයීම් ක්‍රියාවලියේ දී නිර්මාණය කරන ලද විනාඩි 2-3ත් අතර කාල පරාසයකින් ඉදිරිපත් කළ රංගනයකි සංගීත ඛණ්ඩයක් ප්‍රතිවාදනය කිරීමේ දී නාට්‍යානුරූපී රංග වින්‍යාසයකින් යුතු අවාචික නිර්මාණාත්මක රංගනයක් ඉදිරිපත් කළ යුතු ය.

විනාඩි 2-4 කාල පරාසයකින් යුත් සංගීත ඛණ්ඩ සංචිතයක් ඇසුරෙන් එක් ඛණ්ඩයකට කල් තබා පුහුණු වූ රංගනයකි. මේ සඳහා 2016 වර්ෂයේ පටන් 2019 වර්ෂය දක්වා අ්‍යෙපාස සා/පෙළ විභාගයේ නිර්මාණාත්මක රංග රචන ක්‍රියාකාරකම සඳහා භාවිත කළ සංගීත ඛණ්ඩ හෝ මෙම ක්‍රියාකාරකම සඳහා යෝග්‍ය යැයි සිසුන් හෝ ගුරු භවතුන් විසින් ම තෝරාගන්නා ලද සංගීත ඛණ්ඩ භාවිත කළ හැකි ය.

මෙහි දී රංග වින්‍යාසය කේන්ද්‍රීය වන අතර  හුදු නර්තනයකින් ඔබ්බට ගොස් නාට්‍යානුසාරී ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු ය.

**ලකුණු 20 ( විනාඩි 04)**

**නිර්ණායක (සෑම නිර්ණායකයක් යටතේ ම උපරිම ලකුණු 05ක් ප්‍රදානය කෙරේ)**

1. සංගීත ඛණ්ඩයේ සුවිශේෂී ආකෘතික ලක්ෂණ හඳුනාගැනීම
2. චලන ප්‍රකාශනය හා අවකාශ භාවිතය
3. මනෝභාවික අන්තර්ගතය හා සංගීත ඛණ්ඩයට අර්ථයක් සම්පාදනය
4. කණ්ඩායමික සාමූහිකත්වය හා සූදානම

## B 1-i සහ B1-ii පෙළ ආශ්‍රිත භාෂණ රංගනය - (කේවල)

නාට්‍ය හා රංග කලාව විෂය සඳහා 10 සහ 11 ශ්‍රේණිවලට නිර්දේශිත නාට්‍ය පෙළ දෙක මේ සඳහා භාවිත කෙරේ ඉන් එකක් ස්වාභාවික සංවාද සහිත පිටපතක් වන අතර අනෙක ශෛලිගත සංවාද සහිත පිටපතකි කොටස් දෙකකින් සමන්විත මෙම ඇගැයීමෙහි එක් කොටසකට ලකුණු 20ක් හිමි වන අතර කොටස් දෙකෙහි ම ලකුණු එකතුව දෙකෙන් බෙදා ඇගැයීමේ අවසාන ලකුණ ලකුණු සටහන් පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

**<u>1 කොටස: සිසුවා හෝ සිසුවිය ගේ තෝරාගැනීම (විනාඩි 02)</u>**

දෙන ලද පිටපත් අතරින් සිසුවා හෝ සිසුවිය කැමති පිටපතකින් කලින් සූදානම් ව පැමිණෙන භාෂණ කොටසක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දේ.

**ලකුණු 20**

**<u>2 කොටස: පරීක්ෂක මණ්ඩලයේ තේරීම (විනාඩි 02)</u>**

සිසුවා හෝ සිසුවිය ඉහත 1 කොටස සඳහා නො තෝරාගත් අනෙක් පෙළෙහි ඕනෑ ම සුදුසු ස්ථානයකින් පරීක්ෂක මණ්ඩලය විසින් තෝරාදෙනු ලබන භාෂණ කොටසක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දේ.

**ලකුණු 20**

**නිර්ණායක (සෑම නිර්ණායකයක් යටතේ ම උපරිම ලකුණු 05ක් ප්‍රදානය කෙරේ)**

1. කටහඬ හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය
2. චරිතයට හා අවස්ථාවට අනුකූල වීම
3. භාවාත්මක නිරූපණය
4. ශාරීරික ප්‍රකාශනය

## B 2. නාට්‍ය ගීතය - (කේවල)

සිසුවා හෝ සිසුවිය කැමති ඕනෑ ම නාට්‍ය ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කළ හැකි යි

නාඩගම් සම්ප්‍රදායෙහි පටන් නූතන යුගය දක්වා වන ඕනෑ ම නාට්‍ය සම්ප්‍රදායකින්/ ශෛලියකින් / නාට්‍යයකින් තෝරාගත් ගීතයක් ගයමින් හා රඟමින් ඉදිරිපත් කළ යුතු යි මෙම ගීතය මුල් කෘතිය තුළ චරිතයක මුවින් ගායනා කෙරෙන ගීතයක් විය යුතු අතර පසුබිම් ගායනයක් නොවිය යුතු යි

**ලකුණු 20 (<u>විනාඩි 03)</u>**

**නිර්ණායක (සෑම නිර්ණායකයක් යටතේ ම උපරිම ලකුණු 05ක් ප්‍රදානය කෙරේ)**

1. තනුව රිද්මය හා ලය
2. හඬ' පාලනය හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය
3. මනෝභාවික අන්තර්ගතය
4. ශාරීරික ප්‍රකාශනය

## B 3. ක්ෂණික නිරූපණය - (කේවල)

දෙන ලද සිද්ධියක්/අවස්ථාවක් නාට්‍යානුසාරී ව ගොඩ නංවමින් එසැණින් නිරූපණය කර පෙන්වීම් මේ සඳහා සූදානම් වීමට විනාඩි 05ක කාලයක් ලබා දිය යුතු යි

**ලකුණු 20 (විනාඩි 03)**

මාතෘකා දෙකක් හෝ කිහිපයක් අතරින් කණ්ඩායම කැමති මාතෘකාවක් තෝරාගැනීමට අවස්ථාව ලබා දේ් එහෙත් සිසුවා හෝ සිසුවිය තමන් තෝරාගත් මාතෘකාව පරීක්ෂක මණ්ඩලය වෙත ලබා දුන් පසු එම මාතෘකාවට පරීක්ෂක මණ්ඩලය විසින් නාට්‍යානුසාරී සිදු විමක් ගොඩ නැංවිය හැකි තවත් සිදු වීමක් එකතු කළ හැකි ආකාරයේ මාතෘකා කොටසක් එකතු කරනු ලබයි

*උදාහරණයක් වශයෙන් දරුවා තෝරාගත් මාතෘකාව වන්නේ "මිනිසුන් බිය ගන්වන චණ්ඩියෙක්" යන්න නම් පරීක්ෂක මණ්ඩලයට, ඔහුගේ සැරපරුෂ බිරිඳ පැමිණේ. යනුවෙන් නාටකීය අවස්ථාවක් ගොඩ නැගිය හැකි මාතෘකා කොටසක් එකතු කළ හැක.*

**නිර්ණායක (සෑම නිර්ණායකයක් යටතේ ම උපරිම ලකුණු 05ක් ප්‍රදානය කෙරේ)**

1. නාට්‍යෝචිත අවස්ථාව ගොඩ නැංවීම.
2. කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම.
3. යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම.
4. ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය.

## ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

# ක්‍රියාකාරකම A 1-i - කෙටි නාට්‍ය නිෂ්පාදනය

| නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- සංවර්ධනය කළ යුතුයි | 1- වඩාත් සංවර්ධනය කල යුතුයි |
|---|---|---|---|---|---|
| නාට්‍ය පිටපත: සිදුවීම්, අවස්ථාවන්, චරිත හා සංවාද | සිදුවීම් පෙළගැස්මෙහි නාට්‍යමය කූඨප්‍රාප්තිය ඉතා ඉහළ ය. විස්වසනීයත්වයෙන් සහ ගැඹුරකින් යුතු චරිත ගොඩනැංවීමකි. ප්‍රබල නාට්‍යමය කාර්ය සාධනයකට තුඩු දෙන දැනුවත් තෝරා බේරා ගැනීම්වලින් සමන්විත ප්‍රකාශන ගුණයෙන් පොහොසත් සංවාද භාවිතයකි. ජීවිතය පිළිබඳ පොදු මානුෂීය අත්දැකීමක් සහ අවබෝධයක් ජනිත කරවන සියුම්/ගැඹුරු යටි පෙළ විභවයන් සහිත ය. ප්‍රේක්ෂකයාගේ අවධානය හා කුතුහලය රඳවා ගනී. | නාට්‍යම අවස්ථාවන් මැනැවින් හඳුනාගෙන ප්‍රබල නාට්‍යමය අත්දැකීමක් නිර්මාණය වන අයුරෙන් සිද්ධි පෙළගස්වා තිබේ. චරිතවල විශ්වසනීයත්වය ඉහළ ය. නාට්‍යමය කාර්ය සාධනයට දායක වන පරිදි මැනැවින් හා සැලකිල්ලෙන් තෝරා බේරාගත් සංවාද භාවිතයක් ඇත. | විශ්වසනීයත්වයෙන් හා තර්කානුකූල බවින් යුතු බොහෝ දුරට නාට්‍යමය කුළුගැන්වීමකට යොමු වූ අවස්ථා/සිද්ධි පෙළගැස්මකි. චරිත ගොඩනැංවීම විශ්වසනීයත්වයකින් හා යම් ගැඹුරකින් යුතු ය. නාට්‍යමය කාර්ය සාධනයට බොහෝ දුරට දායක වන සංවාද භාවිතයක් ඇත. | කතාවේ යම් ගලා යාමක් දක්නට ඇතත් විටෙක එය අපැහැදිලි ය. අවස්ථාවන් සිදුවීම් නාට්‍යමය කාර්ය සාධනයකට තරමක් දුරට දායක වේ. චරිත ගොඩනැංවීමක් ඇතත් එය බොහෝ දුරට පැතැලි වර්ග චරිත ස්වරූපයකින් යුතු ය. සංවාදවල ප්‍රකාශනාත්මක ගුණය තවත් සංවර්ධනය විය යුතු මට්ටමක පවතී. | කතාව වටහා ගැනීම අපහසු ය. සිදුවීම්වල අනොන්‍ය ගැලපීමක් නැති අවස්ථාවන් සිදුවීම් ඇතත් ඒවා නාට්‍යමය කාර්ය සාධනයකට තුඩු දෙන ලෙස විකාශනය නොවේ. චරිතවල විශ්වසනීයත්වයක් හෝ පැහැදිලි බවක් නැති නාට්‍යමය අරමුණක් රහිත හුදු සංවාද උච්චාරණයක් පමණි. |
| ශාරීරික ප්‍රකාශනය සහ අවකාශ භාවිතය | විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. රංග කාර්යය සිදු වන සීමිත අවකාශය භාවිතය හා ශාරීරික ප්‍රකාශනයන් හා අතිශයින් ම නිර්මාණාත්මක චරිතවල සහ සිදුවීම්වල ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. | චරිත/ සිද්ධිවල අවශ්‍යතාවයට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ හා අවකාශ භාවිතය පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත යි. රංගන අවකාශයේ සීමාසහිත බව නොතකා මැනැවින් තම ඉදිරිපත් කිරීම සිදු කරයි. | තේරාගන්නා ශාරීරික චලනයන්/අවකාශ භාවිතයන් බොහෝ විට චරිත හා අවස්ථාවන්ට ගැලපෙන ඒවා විසින් ඉල්ලා සිටින චලන වේ. රංගන අවකාශය පිළිබඳ වැටහීමකින් යුතුව ඉදිරිපත් කිරීම සිදු කරයි. | ශාරීරික චලන හා අවකාශ භාවිතයන් මගින් යම් පමණකින් චරිත හා අවස්ථාවන් ඉස්මතු වුවත් ඒවා මැනැවින් නිරූපණය නොකෙරේ. ලැබී ඇති සීමිත රංගන අවකාශය පිලිබඳ වැටහීම හා අවධානය ප්‍රමාණවත් නැත. | යම් ශාරීරික ප්‍රකාශනයන් අවකාශ භාවිතයන් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. නොගැළපෙන හා අනවබෝධයෙන් යුතු ඉදිරිපත් කිරීමකි.ලබා දී ඇති රංගන අවකාශය පිලිබඳ කිසිදු සැලකීමක් හෝ අවබෝධයක් නැත. |
| රංග වස්ත්‍ර රංග භාණ්ඩ සරල පසුතල අංග රචනය සහ සංගීත/හඬ භාවිතය | ආනුෂංගික අංග භාවිතයේ දී විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. අතිශයින් ම නිර්මාණාත්මක ලෙස ඒවා කෘතියට එකතු කර ඇත. | නාට්‍යයේ අවශ්‍යවතාවන්ට අනුකූල ව ඒ ඒ ආනුෂංගික කලාවන් භාවිත කළ යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත ය. නිර්මාණයට අදාළව මනා සැලකිල්ලකින් සැලසුම් කළ හා සූදානම් කළ ආනුෂංගික අංග භාවිතය ප්‍රබල නාට්‍යමය අත්දැකීමක් සඳහා දායක වේ. | නිර්මාණයට අදාළව ආනුෂංගික අංග භාවිත කර තිබේ. නාට්‍යයේ ආනුෂංගික අංග භාවිතයේ අවශ්‍යතාවන් සපුරාලයි. සීමිත රංග අවකාශය තුළ මැනැවින් භාවිත කළ හැකි යි. | ආනුෂංගික අංග බහුතරයක් නිර්මාණයට යම් අදාලත්වයක් පෙන්වයි. එහෙත් එම අංග තවත් සංවර්ධනය කළ හැකි බව සහ සංවර්ධනය කළ යුතු බව පැහැදිළිව ම දිස් වේ. | ආනුෂංගික අංග එකක් හෝ කිහිපයක් භාවිත කළ ද නිර්මාණයට ඒවායෙහි ගැලපීමක් නැත. නැතහොත් නාට්‍යයෙහි අවශ්‍යතාවන්ට කිසිසේත් අදාල නැත. |
| කණ්ඩායම් සාමූහිකත්වය හා සූදානම | විශිෂ්ට කුසලතාවකින් යුතුව කණ්ඩායම් සාමූහික බව ප්‍රදර්ශනය කෙරේ. රංග කාර්යය පිලිබඳ සාමූහික අවබෝධය සහ කැපවීම ඉතා ඉහළ මට්ටමකින් පවතින අතර අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය නිරායාසයෙන් සිදු වේ. ප්‍රමාණවත් පෙර පුහුණුවීම් සහිත බව ප්‍රකට කාල කලමනාකරණය මැනැවින් සිදු කරයි. | ඉහළ කණ්ඩායම් සාමූහිකත්වයක් ප්‍රදර්ශනය කෙරේ. රංග කාර්යය පිලිබඳ සාමූහික අවබෝධය, ඊට දක්වන දායකත්වය සහ අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය දෘශ්‍යමාන වේ. | කණ්ඩායම් සාමූහිකත්වයක් ඇති රංග කාර්යය පිලිබඳ සාමූහික අවබෝධය ඊට දක්වන දායකත්වය සහ අඛණ්ඩ අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයක් දෘෂ්‍යමාන වේ. සාමූහිකව පෙර පුහුණුවීම්වල යෙදුනු බව ප්‍රකට වන මුත් සාමූහික ගොඩ නැංවීම ප්‍රශස්ත මටටමක නොපවතියි. | කණ්ඩායමක් ලෙස කටයුතු කළත් රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය එතරම් කැපී නොපෙනේ. සීමිත මට්ටමක අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයක් පවතී. පුහුණුවීම් මඳකම ප්‍රකට කරයි. | කණ්ඩායමක් ඇත. එහෙත් අන්‍යෝන්‍ය අන්තර් කයිුකාකාරීත්වය දුර්වල යි. ඇතැමුන් සාමූහික වගකිමට උර නොදේ. ඇතැමුන් කණ්ඩායම අතර සැඟවීමට උත්සාහ දරයි.සූදානම අවම යි. පෙර පුහුණුවීම් ඇති බව ප්‍රකට නොකරයි. |

## A ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

# ක්‍රියාකාරකම A 1-ii - කතා පුවතක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම

| නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- සංවර්ධනය කළ යුතුයි | 1- වඩාත් සංවර්ධනය කළ යුතුයි |
|---|---|---|---|---|---|
| **කතන්දරය තෝරා ගැනීම හා ඒ පිළිබඳ මනා අවබෝධය** | කතාන්දරයේ ඇති ප්‍රබල නාට්‍යමය අවස්ථාවන් මැනැවින් හඳුනාගෙන තිබේ. කතාවේ මුඛ්‍ය අර්ථය හා සිදුවීම්වල සීමාවන් අතික්‍රමණය කරමින් ජීවිතය පිළිබඳ පොදු මානුෂීය අත්දැකීමක් සහ අවබෝධයක් ජනිත කරවන අයුරින් කතාව ඉදිරිපත් කරයි. ප්‍රේක්ෂකයා ගේ අවධානය හා කුතුහලය රඳවාගනිමින් රසවත් ව ඉදිරිපත් කරයි. | කතාන්දරයේ ඇති ප්‍රබල නාට්‍යමය අවස්ථාවන් මැනැවින් හඳුනාගෙන ඇත. ඒවා දෘශ්‍යකරණය කළ යුතු ආකාරය පිළිබඳ මනා වැටහීමකින් යුතු ව නිර්මාණාත්මක ව හා අපූර්වත්වයෙන් ඉදිරිපත් කරයි. අර්ථවත් හා පැහැදිලි බවකින් යුතු යි. ප්‍රේක්ෂකයා ගේ/ ශ්‍රාවකයා ගේ අවධානය හා කුතුහලය පවත්වාගනී. නිරායාසකර ගලායාමක් සහිත යි. | නාට්‍යමය අයුරින් ඉදිරිපත් කළ හැකි කතාන්දරයක් තෝරාගෙන ඇත. අර්ථාන්විත ව හා රසවත් බවින් යුතු ව ප්‍රේක්ෂකයා ගේ ශ්‍රාවකයා ගේ උනන්දුව ජනිත කරවන අයුරින් රසවත් ව ඉදිරිපත් කරයි. | කතාන්දරයක් ඉදිරිපත් කරයි. යම් පමණකට එය නාටකීය ලෙස ඉදිරිපත් කිරීමට ප්‍රයත්න දරයි. එහෙත් රසවත් බවින් තොරයි. අර්ථාන්විත බවක් හෝ අපූර්වත්වයක් නැත. | අර්ථාන්විත බවක් නැත. අපූර්වත්වයක් ද නැත. කතාව පිළිබඳ පැහැදිලි වැටහීමක් නැතත් කතාන්දරයක් ඉදිරිපත් කෙරේ. |
| **කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම** | විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි ය. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. කතාන්දරයේ චරිත හා අවස්ථාවන්ට ගැළපෙන පරිදි නිර්මාණාත්මක ව භාවිත කරයි. සියුම් යටි අරුත් ආශ්‍රිත සංකීර්ණතාවන් ඉස්මතු වන ආකාරයේ මනෝභාවික අන්තර්ගතයකින් යුක්තය. චරිත/අවස්ථා මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිලි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත ය. චරිත, සිදුවීම් සහ අවස්ථාවන්ට ගැළපෙන, ඒවා මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. චරිත හා අවස්ථාවන් පිළිබඳ අවබෝධයකින් යුතු ව ඒවායේ මනෝභාවික අන්තර්ගතයන් පොහොසත් කර තිබේ. | පැහැදිලි, නිවැරදි උච්චාරණයක් හා මනා හඬ පාලනයක් ඇත. ප්‍රකාශන ගුණයෙන් යුතු ය. චරිත ස්වභාවයන් සහ අවස්ථාවන් ඉස්මතු කර පෙන්වයි. ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතවලට සහ අවස්ථාවන්ට බෙහෙවින් අනුකූල වේ. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. කතන්දරයට උචිත උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් සිදුවීම් හා අවස්ථාවන් මැනැවින් විශද නො වේ. | කතන්දරය ඒකාකාරී යි. උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන යි. අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි ය. අපැහැදිලි ය. කතන්දරයේ සිදුවීම් ඉදිරිපත් කිරීම පිණිස උච්චාරණ විලාසය නොගැලපේ. |
| **ශාරීරික ප්‍රකාශනය, රංග උපක්‍රම සහ අවකාශ භාවිතය** | විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. චලන අතිශයින් ම නිර්මාණාත්මක යි. චරිතවල සහ සිදුවීම්වල ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. චරිතය හා අවස්ථාව සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. සරල නාට්‍යෝපකරණ හා සරල පසුතලමය ආධාරකයන් අතිශයින්ම නිර්මාණාත්මක අයුරින් භාවිත කරයි. | චරිත හා අවස්ථාවන් සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. චරිත/ සිද්ධිවල අවශ්‍යතාවට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත යි. නාට්‍යෝපකරණ, (අවශ්‍යනම් රූකඩ) පසුතලමය අධාරක වේශභූෂණ යනාදිය සරළ හා අවම වශයෙන් කතාව පොහොසත් කිරීමට උචිත පරදි භාවිත කරයි. | කණ්ඩායමේ එක් එක් සාමාජිකයන් තෝරාගන්නා ශාරීරික චලන හා අවකාශ භාවිතය බොහෝ විට චරිත හා අවස්ථාවට ගැලපෙන ඒවා විසින් ඉල්ලා සිටිනු ලබන චලන වේ. | කණ්ඩායමේ එක් එක් සාමාජිකයන් ඉදිරිපත් කරන ශාරීරික චලන හා අවකාශ භාවිතය මගින් යම් පමණකින් චරිත හා අවස්ථා පිළිබිඹු කරවනසුළු වුවත් ඒවා මැනැවින් නිරූපණය නො වේ. | යම් ශාරීරික ප්‍රකාශනයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. ඉදිරිපත් කළ ද නොගැළපෙන, අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. |
| **කණ්ඩායම් සාමූහිකත්වය හා සූදානම** | විශිෂ්ට කුසලතාවකින් යුතුව කණ්ඩායම් සාමූහික බව ප්‍රදර්ශනය කෙරේ. රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය සහ කැපවීම ඉතා ඉහළ මට්ටමකින් පවතින අතර අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය නිරායාසයෙන් සිදු වේ. ප්‍රමාණවත් පෙර පුහුණුවීම් සහිතය. කාල කලමනාකරණය මැනැවින් සිදු කරයි. | ඉහළ කණ්ඩායමික සාමූහිකත්වයක් ප්‍රදර්ශනය කෙරේ. රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය, ඊට දක්වන දායකත්වය සහ අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය දෘශ්‍යමාන වේ. | කණ්ඩායම් සාමූහිකත්වයක් ඇත. රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය, ඊට දක්වන දායකත්වය සහ අඛණ්ඩ අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයක් දෘෂ්‍යමාන වේ. සාමූහිකව පෙර පුහුණුවීම්වල යෙදුනු බව ප්‍රකට වන මුත් සාමූහික ගොඩ නැංවීම ප්‍රශස්ත මටටමක නොපවතී. | කණ්ඩායමක් ලෙස කටයුතු කළත් රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය එතරම් කැපී නොපෙනේ. සීමිත මට්ටමක අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයක් පවතී. පුහුණුවීම් මඳකම ප්‍රකට කරයි. | කණ්ඩායමක් ඇත. එහෙත් අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය දුර්වල ය. ඇතැමුන් සාමූහික වගකීමට උර නො දේ. ඇතැමුන් කණ්ඩායම අතර සැඟවීමට උත්සාහ දරයි. සූදානම අවම යි. පෙර පුහුණුවීම් ඇති බව ප්‍රකට නොකරයි. |

### ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

## ක්‍රියාකාරකම A 2 ඇගැයීම -  නිර්මාණාත්මක රංග රචනය :Choreography)

| නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- සංවර්ධනය කළ යුතුයි | 1- වඩාත් සංවර්ධනය කළ යුතුයි |
|---|---|---|---|---|---|
| **සංගීත ඛණ්ඩයේ සුවිශේෂී ආකෘතික ලක්ෂණ හඳුනාගැනීම** | විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් පරිපූර්ණ වශයෙන් ම හඳුනාගැනිමට සමත් වේ. | සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. | සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන් හඳුනාගෙන ඇත. | සංගීත ඛණ්ඩයේ යම් යම් ආකෘතික ලක්ෂණ හඳුනාගෙන ඇති බව පෙනේ. | සංගීත ඛණ්ඩයේ ඇති ආකෘතික ලක්ෂණ නිවැරදිව හඳුනා ගැනීමට උත්සාහ කරයි. |
| **සංගීත ඛණ්ඩයට අර්ථයක් සම්පාදනය කිරීම හා මනෝභාවික අන්තර්ගතය** | සියුම් මනෝභාවික සංකීර්ණතාවන් ඉස්මතු වන ආකාරයෙන් සහ සංගීත ඛණ්ඩය මගින් ප්‍රමුඛ ලෙස ගම්‍ය කරවන අර්ථයන් ඉක්මවා යමින් සංකීර්ණ/ ප්‍රබල/ සියුම් නව අර්ථකථනයකින් යුත් නාටකීය අවස්ථාවක්/සිදුවීමක් ගොඩ නැගීම ආශ්‍රිත සංකීර්ණ මනෝභාවයන් ප්‍රකට කරයි. නාදමය සුවිශේෂතාවන් මගින් ප්‍රමුඛ ව ගම්‍ය කරවන අරුත් ඉක්මවා යමින් සංකීර්ණ/ ප්‍රබල/ සියුම් නව අර්ථකථනයකින් යුත් නාටකීය අවස්ථාවක්/සිදුවීමක් ගොඩ නංවයි. | මනෝභාවික සංකීර්ණතාවන් මැනැවින් පිළිබිඹු වේ. සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් සහ ගොඩ නගන අවස්ථාවේ නාටකීය ස්වභාවය හඳුනාගෙන ඒ පිළිබඳ අවබෝධයෙන් යුතු ව එහි මනෝභාවික අන්තර්ගතය පොහොසත් කර තිබේ. යම් නාටකීය බවකින් යුතු අවස්ථාවක්/සිදුවීමක් ආශ්‍රිත අර්ථයක් සම්පාදනය කරයි. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන්ට බෙහෙවින් අනුකූල වේ.<br>සංගීත ඛණ්ඩයට හඳුනාගත හැකි යම් අර්ථයක් සම්පාදනය කරයි. | ඉදිරිපත් කිරීම තුළ මනෝභාවික අන්තර්ගතයක් ඇත. සංගිත ඛණ්ඩයේ මනෝභාවික ලක්ෂණ හා හා යම් පමණකින් අනුගත ය. සංගීත ඛණ්ඩයට යම් අර්ථකථනයක් සපයන බව පෙනේ. එහෙත් එය තවත් සංවර්ධනය විය යුතු ය. නැතහොත් අර්ථකථනය ප්‍රමාණවත් නැත. නැතහොත් අර්ථකථනය සංගීත ඛණ්ඩයේ ලක්ෂණ හා අනුගත නැත. | ඉදිරිපත් කිරීම තුළ යම් මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය එක්කෝ සංගීත ඛණ්ඩය හා ඍජු ව අනුගත නැත. නැතහොත් මැනැවින් විශද නො වේ. සංගීත ඛණ්ඩයට යම් ආකාරයක අර්ථයක් සැපයීමට උත්සාහ කරන බවක් නොපෙනේ. |
| **චලන, ප්‍රකාශනය හා අවකාශ භාවිතය** | චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. අවස්ථාවේ නාට්‍යමය බව ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. සංගීත ඛණ්ඩයේ නාදමය සුවිශේෂත්වයන් සමග අත්‍යන්තයෙන් බැඳුණු අපූර්ව ශාරීරික ප්‍රකාශනයකි. අවකාශය අර්ථවත් ව, යෝග්‍ය පරිදි භාවිත කරමින් ප්‍රබල දෘශ්‍ය රූප සංරචනයක් නිර්මාණය කෙරේ. | සංගීත ඛණ්ඩයේ නාදමය සුවිශේෂත්වයන්, සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. අවස්ථාවේ නාටකීය ස්වභාවය ඉස්මතු කරවන අපූර්ව දෘශ්‍ය රූප සංරචනයන් ඇතුළත් චලන ප්‍රකාශනයන් සහිතයි. | චලන ප්‍රකාශනයන් සංගීත ඛණ්ඩයේ තනුවේ නාදමය සුවිශේෂත්වයන්, රිද්මය හා ලය පිළිබඳ අනන්‍යතාවන් සහ හඬ උච්චාවචනයන් පිළිබඳ සුවිශේෂත්වයන්ට බෙහෙවින් ගැලපෙන ලෙස නිර්මාණය කරයි. අවකාශය යෝග්‍ය ලෙස භාවිත කරමින් නිර්මාණාත්මක දෘශ්‍ය රූප සංරචනයක් ඉදිරිපත්කරයි. | ඉදිරිපත් කරන චලන ප්‍රකාශනයන් යම් පමණකින් සංගීත ඛණ්ඩය හා ගලපා ගැනීමට උත්සාහ කරයි. අවකාශ භාවිතය මැනැවින් සිදු නො වේ. | යම් චලන ප්‍රකාශනයක් ඇතත් සංගීත ඛණ්ඩයට නොගැළපෙන, අනවබෝධයෙන් යුතු චලන ප්‍රකාශනයකි. |
| **කණ්ඩායමික සාමූහිකත්වය හා සූදානම** | විශිෂ්ට කුසලතාවකින් යුතුව කණ්ඩායමික සාමූහික බව ප්‍රදර්ශනය කෙරේ. රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය සහ කැපවීම ඉතා ඉහළ මට්ටමකින් පවතින අතර අන්‍යොන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය නිරායාසයෙන් සිදු වේ. ප්‍රමාණවත් පෙර පුහුණුවීම් සහිත බව ප්‍රකට කාල කලමනාකරණය මැනැවින් සිදු කරයි. | ඉහළ කණ්ඩායම් සාමූහිකත්වයක් ප්‍රදර්ශනය කෙරේ. රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය ඊට දක්වන දායකත්වය සහ අන්‍යොන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වය දෘශ්‍යමාන වේ. | කණ්ඩායම් සාමූහිකත්වයක් ඇත. රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය, ඊට දක්වන දායකත්වය සහ අඛණ්ඩ අන්‍යොන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයක් දෘෂ්‍යමාන වේ. සාමූහිකව පෙර පුහුණුවීම්වල යෙදුනු බව ප්‍රකට වන මුත් සාමූහික ගොඩ නැංවීම ප්‍රශස්ත මට්ටමක නොපවති. | කණ්ඩායමක් ලෙස කටයුතු කළත් රංග කාර්යය පිළිබඳ සාමූහික අවබෝධය එතරම් කැපී නොපෙනේ. සීමිත මට්ටමක අනොන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයක් පවති. පුහුණුවීම් මඳ කම ප්‍රකට කරයි. | කණ්ඩායමක් ඇත. එහෙත් අන්‍යෝන්‍ය අන්තර් ක්‍රිකාකාරීත්වය දුර්වල යි. ඇතැමුන් සාමූහික වගකීමට උර නො දේ. ඇතැමුන් කණ්ඩායම අතර සැඟවීමට උත්සාහ දරයි. සූදානම අවම යී පෙර පුහුණුවීම් ඇති බව ප්‍රකට නොකරයි. |

## ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

# ක්‍රියාකාරකම B 1-i සහ B 1-ii - පෙළ ආශ්‍රිත භාෂණ රංගනය

| නිර්ණායකය | 5- විශිෂ්ට යි | 4- ඉතා හොඳ යි | 3- හොඳ යි | 2- සංවර්ධනය කළ යුතු යි | 1- වඩාත් සංවර්ධනය කළ යුතුයි |
|---|---|---|---|---|---|
| **කටහඬ හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය** | විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි යි. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවති. චරිතයට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. | පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් සහිත ය. කටහඬ පාලනය හොඳයි. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ අවස්ථාවල ප්‍රකට කරයි. එහෙත් තානීය විවධත්වය, ප්‍රක්ෂේපණය හා උච්චාරණ විලාසයන් තවත් වැඩිදියුණු කිරීමේ හැකියාව හා කුසලතාව පැහැදිළි ව දක්නට ඇත. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතය මැනැවින් විශද නො වේ. | උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන ය. හුදු පෙළ කියවීමකි. අනවශ්‍ය ලෙස වේගවත් ය/මන්දගාමී ය/ අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි යි. අපැහැදිළි ය. උච්චාරණ විලාසය චරිතයට අදාළ නැත. |
| **චරිතයට හා අවස්ථාවට අනුකූල වීම** | සමස්ත ඉදිරිපත් කිරීම තුළ නළුවා/නිළිය චරිතය මුළුමණින්ම ස්වීකරණය ව ඊට අනන්‍ය ව ඇත. සියුම් යටි පෙළ අරුත් ආශ්‍රිත සංකීර්ණතාවන් ඉස්මතු වන ආකාරයෙන් සහ පෙළෙහි නිරූපිත අදාළ චරිත ස්වභාවයට හානි නොවන ස්වාධීන ගොඩනැංවීමකි. | චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් චරිතය ස්වීකරණය කරගෙන තිබේ.එය මැනැවින් නිරූපණය වේ. චරිතය පිළිබඳ විශ්වසනීය ඉදිරිපත් කිරීමකි. | චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. චරිතය තුළ රැඳීසිටීමට උත්සාහ දරයි. ඉදිරිපත් කිරීම තුළ චරිතය පිළිබඳ යම් විශ්වසනීයත්වයක් ගොඩ නැගේ. | ඉදිරිපත් කිරීම තුළ චරිත ස්වභාවය පිළිබිඹු කිරීමට ප්‍රයත්න දරයි. එහෙත් එය ස්ථාවර නැත. චරිතයේ අනන්‍යතාව පැහැදිළි ව විශද නො වේ. | ඉදිරිපත් කිරීම තුළ චරිතයේ ඡායාමාත්‍රයක් දැකිය හැකි ය. |
| **භාවාත්මක නිරූපණය** | චරිතයේ සංකීර්ණ මනෝභාවයන් නිරූපණයේ දී දරුවාගේ වයස් මට්ටමේ දී අපේක්ෂා කළ නොහැකි තරම් විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. | මනෝභාවික සංකීර්ණතාවන් මැනැවින් පිළිබිඹු කරයි. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතයට, අවස්ථාවට, නාට්‍යයට සහ ශෛලියට බෙහෙවින් අනුකූල වේ. | ඉදිරිපත් කිරීම තුළ චරිතයට හා අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් යම් පමණකින් පිළිබිඹු කරයි. | ඉදිරිපත් කිරීමෙහි යම් මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය චරිතයට හා අවස්ථාවට එතරම් අනුකූල නැත. |
| **ශාරීරික ප්‍රකාශනය** | චලන අතිශයින් ම නිර්මාණාත්මක යි. චරිතයේ ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. | චරිතය හා අවස්ථාව සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලනයන් ඉදිරිපත් කරයි. චරිතයේ අවශ්‍යවතාවට, නාට්‍යයේ ශෛලියට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත යි. | දරුවා තේරාගන්නා ශාරීරික චලන බොහෝ විට චරිතයට හා අවස්ථාවට ගැළපෙන අතර චරිතය, අවස්ථාව, නාට්‍යය හා ශෛලිය විසින් ඉල්වා සිටිනු ලබන චලන වේ. | දරුවා ඉදිරිපත් කරන ශාරීරික චලනයන් යම් පමණකින් චරිතය හා අවස්ථාව පිළිබිඹු කරවන සුළු යි. | යම් ශාරීරික ප්‍රකාශනයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත. ඉදිරිපත් කළ ද නොගැළපෙන අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. |

### A ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

## ක්‍රියාකාරකම B 2- නාට්‍ය ගීතය

| නිර්ණායකය | 5- විශිෂ්ටයි | 4- ඉතා හොඳයි | 3- හොඳයි | 2- සංවර්ධනය යුතුයි | 1- වඩාත් සංවර්ධනය කළ යුතුයි |
|---|---|---|---|---|---|
| **තනුව, රිද්මය හා ලය** | තනුව, රිද්මය හා ලය මුල් කෘතියට අනුකූලවත්, චරිතයට සහ අවස්ථාවට උචිත ලෙසත් පවත්වා ගනියි. එමෙන් ම නිරායාසකරව ගායනය ඉදිරිපත් කළ හැකි උචිත ස්වර පරාසයක පිහිටා සිටි. ඇතැම් විට මුල් ගීතයට හානිකර නොවන සියුම් නිර්මාණාත්මක එකතු කිරීම් පවා තනුව හා තාලය ආශ්‍රිත ව සිදු කරයි. | ගායනයෙහි තනුව, රිද්මය හා ලය මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගන්නා අතර ම රංගනයේ හා ශාරීරික චලනයන් ගේ ප්‍රකාශනාත්මක ගුණය ඉස්මතු කරගත හැකි ආකාරයේ ස්වර පරාසයකින් ඉදිරිපත් කරයි. | ගායනයෙහි තනුව, රිද්මය හා ලය මුල් ගීතයට අනුකූල ව මුල සිට අග දක්වා ම පවත්වා ගනියි. පිහිටා සිටින ස්වර පරාසය උචිත යි. | ගායනයෙහි තනුව හා තාලය මුල් ගීතයට අනුව යම් තරමකට පවත්වා ගනී. එහෙත් එය ස්ථාවර නැත. කඩින් කඩ බිඳ වැටෙනසුළු ය. විටින් විට අපස්වර ගැයේ. නැතහොත් රිද්මයෙන් පිට පනී. ලය ස්ථාවර නැත. | ගායනය ඉදිරිපත් කළ ද ගීතයෙහි තනුව හෝ තාලය යන දෙකෙන් එකක් වැරදි ය. අපස්වර ස්ථාන බහුල වීම සහ ලය ඉතා මන්දගාමී හෝ අතිශය ශීඝ්‍ර හෝ ඛණ්ඩනය වනු පෙනේ. |
| **හඬපාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණ** | පදමාලාව නිවැරදි ය. හඬ ප්‍රක්ෂේපණය හා පාලනය විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරවන සුලු ලෙස පවත්වා ගනී. චරිතයට සහ අවස්ථාවට උචිත ලෙස හඬ පාලනය පවත්වාගනී. | හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයේ, අවස්ථාවේ මනෝගතියට උචිත තානීය විවිධත්වයකින් හා හඬ පාලනයකින් සමන්විත යි. | ශ්‍රවණය කළ හැකි අතර මනෝභාවික හා ශාරිරික ප්‍රකාශනාත්මක ගුණයන් ඉස්මතුවන සුලු යි. පදමාලාව නිවැරදි ය. | ඇතැම් විට වචන අමතක වී වැරදි වචන උච්චාරණය වේ. හඬ ප්‍රක්ෂේපණය ස්ථාවර මට්ටමක නොපිහිටයි. | පදමාලාව මතක නැත. හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය දුර්වලයි. |
| **මනෝභාවික අන්තර්ගතය** | චරිතයේ සංකීර්ණ මනෝභාවයන්, විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයකින් යුතු ව නිරූපණය කෙරේ. සියුම් යටි පෙළ අරුත් ආශ්‍රිත සංකීරණතාවන් ඉස්මතු වන ආකාරයෙන් සහ පෙළෙහි නිරූපිත අදාළ චරිත ස්වභාවයට හානි නොවන ආකාරයේ මනෝභාවික අන්තර්ගතයකින් යුක්ත යි. | මනෝභාවික සංකීර්ණතාවන් මැනවින් පිළිබිඹු වේ. චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් යුතු ව එහි මනෝභාවික අන්තර්ගතය පොහොසත් කර තිබේ. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතයට, අවස්ථාවට, නාට්‍යයට සහ ශෛලියට බෙහෙවින් අනුකූල වේ. චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. චරිතය තුළ රැඳීසිටීමට උත්සාහ දරයි. | ඉදිරිපත් කිරීම තුළ චරිතයට හා අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් යම් පමණකින් පිළිබිඹු කරයි. | ගායනයේ දී චරිතයේ ඡායාමාත්‍ර මනෝභාවික අන්තර්ගතයක් ඇත. එහෙත් එය චරිතයට හා අවස්ථාවට එතරම් අනුකූල නැත. |
| **ශාරීරික ප්‍රකාශනය** | චලන අතිශයින් ම නිර්මාණාත්මක ය. චරිතයේ ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. ගීතයේ රිද්මය හා ලය සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර ශාරීරික ප්‍රකාශනයකි. | චරිතය හා අවස්ථාව සමග අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. චරිතයේ අවශ්‍යවතාවට, නාට්‍යයේ ශෛලියට, ගීතයේ රිද්මයට හා ලයට අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත යි. | දරුවා තෝරාගන්නා ශාරීරික චලන බොහෝ විට චරිතයට හා අවස්ථාවට ගැළපෙන අතර චරිතය අවස්ථාව නාට්‍යය හා ශෛලිය විසින් ඉල්වා සිටිනු ලබන චලන වේ. ගීතයේ රිද්මයට හා ලයට අනුකූල යි. | දරුවා ඉදිරිපත් කරන ශාරීරික චලන යම් පමණකින් චරිතය හා අවස්ථාව පිළිබිඹු කරවන සුළු ය. | යම් ශාරීරික ප්‍රකාශනයක් තිබේ. එහෙත් එය ප්‍රමාණවත් නැත.ඉදිරිපත් කළ ද ගීතයට නොගැළපෙන අනවබෝධයෙන් යුතු ශාරීරික ප්‍රකාශනයකි. |

### ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

## ක්‍රියාකාරකම B 3- ක්ෂණික නිරූපණය

| නිර්ණායකය | 5- විශිෂ්ට යි | 4- ඉතා හොඳ යි | 3- හොඳ යි | 2- වැඩි දියුණු කළ යුතු යි | 1- වඩාත් සංවර්ධනය විය යුතුයි |
|---|---|---|---|---|---|
| **නාට්‍යෝචිත අවස්ථාව ගොඩ නැංවීම** | දී ඇති මාතෘකාව විනිවිද ගිය, අපූර්වත්වයකින් යුතු ක්‍රියා විකාශනයකින් සමන්විත නාට්‍යමය කූටප්‍රාප්තියක් කරා යොමු වේ. විශිෂ්ට මට්ටමේ නිර්මාණශීලී පරිකල්පනයක් ප්‍රකට කරයි. | ආරම්භයේ පටන් ක්‍රමානුකූල ව නාට්‍යමය කූටප්‍රාප්තියක් කරා ඉලක්කගත වූ ක්‍රියා විකාශනයකින් යුක්ත වේ. | ඉදිරිපත් කරන සිදුවීම තුළ නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැංවේ. එය අවසාන මාතෘකාවට/තේමාවට අනුකූල වේ. | ඉදිරිපත් කරන සිදුවීම තුළ යම් නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නැගුණ ද එය සංවර්ධනය වී නැත. | යම් කිසි ක්‍රියාවක් (සිද්ධියක් ඉදිරිපත් වේ) නාට්‍යමය අවස්ථාවක් නැත. එක්කෝ සිදු වීම අතර මඟින් අවසන් වේ. |
| **කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම** | විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. භාෂණය පහසුවෙන් වටහාගත හැකි යි. ප්‍රකාශන ගුණයෙන් ඉතා පොහොසත් වේ. තානීය විවිධත්වය නිර්මාණාත්මක ව භාවිත කරයි. | පැහැදිළි ව හා නිවැරදි ව උච්චාරණය කරයි. හඬ ප්‍රක්ෂේපණය ප්‍රශස්ත මට්ටමක පවතී. චරිතයට ගැළපෙන, එය මැනැවින් නිරූපණය වන උච්චාරණයකි. තානීය විවිධත්වය ඉතා හොඳ යි. | පැහැදිළි හා නිවැරදි උච්චාරණයක් හා මනා හඬ පාලනයක් ඇත. චරිතයට ගැළපෙන උච්චාරණයක් බොහෝ විට ප්‍රකට කරයි. චරිත ස්වභාවය සහ අවස්ථාව ඉස්මතු වී පෙනේ. | ප්‍රකාශනාත්මක ගුණයෙන් යුතු අවස්ථා ඇත. පැහැදිලි උච්චාරණයක් ප්‍රකට කළත් වාක්‍ය/වචන අග දී හඬ වියැකී යයි. චරිතයට අනුකූල උච්චාරණයක් විටින් විට දැකිය හැකි නමුත් ඉන් චරිතයේ අනන්‍යතාව මැනැවින් විශද නො වේ. | චරිතයේ ඡායාමාත්‍රයක් දැකිය හැකි ය. එහෙත් එය අවස්ථාවට එතරම් අනුකූල නැත. උච්චාරණය දුර්වල යි/ ඒකාකාරී තානයකින් යුතු ය/ ප්‍රකාශන ගුණයෙන් හීන යි. අපහසුවෙන් ශ්‍රවණය කළ හැකි යි. අපැහැදිළි යි. |
| **යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම** | සියුම් යටි අරුත් ආශ්‍රිත සංකීර්ණතාවන් ඉස්මතු වන ආකාරයෙන් අදාළ චරිත ස්වභාවයට අනුකූල මනෝභාවික අන්තර්ගතයකින් යුක්ත යි. චරිතය මැනැවින් පිළිබිඹු වේ. | චරිත ස්වභාවය සහ අවස්ථාව පිළිබඳ අවබෝධයෙන් යුතු ව එහි මනෝභාවික අන්තර්ගතය පොහොසත් කර තිබේ. | ඉදිරිපත් කිරීමෙහි ඇති මනෝභාවික අන්තර්ගතය චරිතයට, අවස්ථාවට බෙහෙවින් අනුකූල වේ. ඉදිරිපත් කිරීම තුළ චරිතය පිළිබඳ යම් විශ්වසනීයත්වයක් ගොඩ නැගේ. | ඉදිරිපත් කිරීම තුළ චරිතයට, අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් යම් පමණකින් පිළිබිඹු කරයි. එහෙත් එය ස්ථාවර නැත. | චරිතයට, අවස්ථාවට අදාළ මනෝභාවික ලක්ෂණයන් ඡායාමාත්‍ර වශයෙන් දැකිය හැකි ය. |
| **ශාරීරික ප්‍රකාශනය සහ අවකාශ භාවිතය** | චලන අතිශයින් ම නිර්මාණාත්මක යි. චරිතයේ ගැඹුර ඉස්මතු කිරීමට බෙහෙවින් දායක වේ. විශිෂ්ට කුසලතාවක් ප්‍රකට කරයි. | චරිතය හා අවස්ථාව සමඟ අත්‍යන්තයෙන් බැඳුණු නිරායාසකර චලන ඉදිරිපත් කරයි. චරිතයේ හා සිද්ධියේ අවශ්‍යතාවට, අනුකූල ව චලනය විය යුතු ආකාරයන් පිළිබඳ දැනුවත් තෝරාගැනීම් සහිත යි. | දරුවා තෝරාගන්නා ශාරීරික චලන හා අවකාශ භාවිතයන් බොහෝ විට චරිතයට හා අවස්ථාවට ගැළපෙන, චරිතය හා අවස්ථාව විසින් ඉල්ලා සිටිනු ලබන චලන වේ. | දරුවා ඉදිරිපත් කරන ශාරීරික චලන හා අවකාශ භාවිතය, යම් පමණකින් චරිතය හා අවස්ථාව පිළිබිඹු කරවන සුළු යි. | යම් ශාරීරික ප්‍රකාශනයක් සහ අවකාශ භාවිතයක් තිබේ. එහෙත් එය චරිතය පිළිබිඹු කිරීමට ප්‍රමාණවත් නැත. |

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020

## පාසල් පාදක තක්සේරුකරණය යටතේ (50) නාට්‍ය හා රංග කලාව විෂයයට අදාළ

## 11 ශ්‍රේණියේ අවසන් තක්සේරුකරණය

ලකුණු ප්‍රදාන ආදර්ශය (එක් අයදුම්කරුවකු සඳහා සවිස්තර ලකුණු සටහනකි)

විභාග අංකය : ................................ දිනය: .......................... මණ්ඩල අංකය: .........................

| ලකුණු | 5- විශිෂ්ට යි / 4- ඉතා හොඳ යි / 3-හොඳ යි /2- සංවර්ධනය කළ යුතු යි / 1-වඩාත් සංවර්ධනය කළ යුතුයි | 5 | 4 | 3 | 2 | 1 | ලකුණු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| A 1 - i | නාට්‍ය පිටපත: සිදුවීම්, අවස්ථාවන්, චරිත හා සංවාද | | | | ✓ | | 0 8 |
| | ශාරීරික ප්‍රකාශනය සහ අවකාශ භාවිතය. | | | | | ✓ | |
| | රංග වස්ත්‍ර, රංග භාණ්ඩ, සරල පසුතල, අංග රචනය සහ සංගීත/හඬ භාවිතය. | | | | ✓ | | |
| | කණ්ඩායමික සාමූහිකත්වය හා සූදානම. | | | ✓ | | | |
| A 1 - ii | කතන්දරය තෝරා ගැනීම හා ඒ පිළිබඳ මනා අවබෝධය | | | | | | |
| | කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම | | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය, රංග උපක්‍රම සහ අවකාශ භාවිතය | | | | | | |
| | කණ්ඩායම් සාමූහිකත්වය හා සූදානම | | | | | | |
| A 2 | සංගීත ඛණ්ඩයේ සුවිශේෂ ආකෘතික ලක්ෂණ හඳුනා ගැනීම | | ✓ | | | | 1 3 |
| | සංගීත ඛණ්ඩයට අර්ථයක් සම්පාදනය කිරීම හා මනෝභාවික අන්තර්ගතය | | | ✓ | | | |
| | චලන, ප්‍රකාශනය හා අවකාශ භාවිතය | | ✓ | | | | |
| | කණ්ඩායම් සාමූහිකත්වය හා සූදානම | | | | ✓ | | |
| B 1 - i | කටහඬ, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | | | ✓ | | | (B 1-i හි ලකුණු ↓) 1 2 |
| | චරිතයට හා අවස්ථාවට අනුකූල වීම | | | ✓ | | | |
| | භාවාත්මක නිරූපණය | | ✓ | | | | |
| | ශාරීරික ප්‍රකාශනය | | | | ✓ | | |
| B 1 - ii | කටහඬ, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | | | ✓ | | | 1 4 (B 1-ii හි ලකුණු ↑) |
| | චරිතයට හා අවස්ථාවට අනුකූල වීම | | ✓ | | | | |
| | භාවාත්මක නිරූපණය | | ✓ | | | | |
| | ශාරීරික ප්‍රකාශනය | | | ✓ | | | B 1-i සහ B 1- ii ලකුණු එකතුව දෙකෙන් බෙදා යොදන්න ↓ 1 3 |
| B 2 | තනුව, රිද්මය හා ලය | ✓ | | | | | 1 7 |
| | හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය | | ✓ | | | | |
| | මනෝභාවික අන්තර්ගතය | | ✓ | | | | |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | | ✓ | | | | |
| B 3 | නාට්‍යෝචිත අවස්ථාව ගොඩ නැංවීම | | | | ✓ | | 0 8 |
| | කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම | | | ✓ | | | |
| | යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම | | | | | ✓ | |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය | | | | ✓ | | |
| අවසාන ලකුණු එකතුව (**උපරිම ලකුණු 100**) | | | | | | | 0 5 9 |

## සැලකිය යුතුයි

- සෑම ඇගැයීමක ම ලකුණු දකුණු පස ඇති ඊට අනුරූපී කොටුවල ඉලක්කම් දෙකකින් සටහන් කරන්න.
- A 1 -I ඇගැයීම සහ A 1 -ii ඇගැයීම යන දෙකෙන් එකක් පමණක් තෝරා ගැනීමට සිදු වන බැවින් මෙම පත්‍රිකාවෙහි ලකුණු සටහන් විය යුත්තේ එම ඇගැයීම්වලට නියමිත කොටුවලින් එක් ඇගැයීමකට නියමිත කොටුවල පමණි. තෝරාගන්නා ඇගැයීමට අනුරූපී කොටසෙහි පමණක් මෙම පත්‍රිකාවෙහි ලකුණු සටහන් කරන්න.
- B 1-I සහ B 1-ii ඇගැයීම් දෙකෙහි ලකුණු ඒ ආසන්න කොටුවල ඇතුළත් කර අනතුරුව එම ඇගැයීම් දෙකෙහි ලකුණුවල එකතුව දෙකෙන් බෙදා ලැබෙන අගය දකුණු පස ඇති කොටුවෙහි ඇතුළත් කරන්න. දශම සංඛ්‍යාවක් ලැබෙන අවස්ථාවක දී එය ඊට ඉහළ ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයන්න.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020

## පාසල් පාදක තක්සේරුකරණය යටතේ (50) නාට්‍ය හා රංග කලාව විෂයයට අදාළ

**විස්තරාත්මක ලකුණු සටහන් පත්‍රය** (එක් අයදුම්කරුවකු සඳහා සවිස්තර ලකුණු සටහනකි)

විභාග අංකය : ................................ දිනය: ........................... මණ්ඩල අංකය:..........................

| ලකුණු | **5- විශිෂ්ට යි / 4- ඉතා හොඳ යි / 3-හොඳ යි /2- සංවර්ධනය කළ යුතු යි / 1-වඩාත් සංවර්ධනය කළ යුතු යි** | 5 | 4 | 3 | 2 | 1 | ලකුණු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| A 1 - i | නාට්‍ය පිටපත: සිදුවීම්, අවස්ථාවන්, චරිත හා සංවාද | | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය, සහ අවකාශ භාවිතය | | | | | | |
| | රංග වස්ත්‍ර, රංග භාණ්ඩ, සරල පසුතල, අංග රචනය සහ සංගීත/හඬ භාවිතය. | | | | | | |
| | කණ්ඩායමික සාමූහිකත්වය හා සූදානම. | | | | | | |
| A 1 - ii | කතන්දරය තෝරා ගැනීම හා ඒ පිළිබඳ මනා අවබෝධය | | | | | | |
| | කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම සහ යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම. | | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය, රංග උපක්‍රම සහ අවකාශ භාවිතය. | | | | | | |
| | කණ්ඩායමික සාමූහිකත්වය හා සූදානම. | | | | | | |
| A 2 | සංගීත ඛණ්ඩයේ සුවිශේෂ ආකෘතික ලක්ෂණ හඳුනා ගැනීම. | | | | | | |
| | සංගීත ඛණ්ඩයට අර්ථයක් සම්පාදනය කිරීම හා මනෝභාවික අන්තර්ගතය. | | | | | | |
| | චලන, ප්‍රකාශනය හා අවකාශ භාවිතය. | | | | | | |
| | කණ්ඩායම් සාමූහිකත්වය හා සූදානම. | | | | | | |
| B 1 - i | කටහඬ, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය. | | | | | | (B 1-i හි ලකුණු ↓) |
| | චරිතයට හා අවස්ථාවට අනුකූල වීම. | | | | | | |
| | භාවාත්මක නිරූපණය. | | | | | | B 1-i සහ B 1- ii ලකුණු එකතුව දෙකෙන් බෙදා යොදන්න ↓ |
| | ශාරීරික ප්‍රකාශනය. | | | | | | |
| B 1 - ii | කටහඬ, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය. | | | | | | |
| | චරිතයට හා අවස්ථාවට අනුකූල වීම. | | | | | | |
| | භාවාත්මක නිරූපණය. | | | | | | (B 1-ii හි ලකුණු ↑) |
| | ශාරීරික ප්‍රකාශනය. | | | | | | |
| B 2 | තනුව, රිද්මය හා ලය. | | | | | | |
| | හඬ පාලනය, හඬ ප්‍රක්ෂේපණය හා උච්චාරණය. | | | | | | |
| | මනෝභාවික අන්තර්ගතය. | | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය. | | | | | | |
| **B 3** | නාට්‍යෝචිත අවස්ථාව ගොඩ නැංවීම | | | | | | |
| | කටහඬ, හඬ ප්‍රක්ෂේපණය, උච්චාරණය චරිතයට හා අවස්ථාවට උචිත වීම. | | | | | | |
| | යෝග්‍ය භාවමය අන්තර්ගතයකින් සමන්විත වීම. | | | | | | |
| | ශාරීරික ප්‍රකාශනය හා අවකාශ භාවිතය. | | | | | | |

| | |
|---|---|
| අවසාන ලකුණු එකතුව (**උපරිම ලකුණු 100**) | |

## සැලකිය යුතුයි

- සෑම ඇගැයීමකම ලකුණු දකුණු පස ඇති ඊට අනුරූපී කොටුවල ඉලක්කම් දෙකකින් සටහන් කරන්න.
- A 1 -I ඇගැයීම සහ A 1 -ii ඇගැයීම යන දෙකෙන් එකක් පමණක් තෝරා ගැනීමට සිදු වන බැවින් මෙම පත්‍රිකාවෙහි ලකුණු සටහන් විය යුත්තේ එම ඇගැයීම්වලට නියමිත කොටුවලින් එක් ඇගැයීමකට නියමිත කොටුවල පමණි. තෝරාගන්නා ඇගැයීමට අනුරූපි කොටසෙහි පමණක් මෙම පත්‍රිකාවෙහි ලකුණු සටහන් කරන්න.
- B 1-I සහ B 1-ii ඇගැයීම් දෙකෙහි ලකුණු ඒ ආසන්න කොටුවල ඇතුළත් කර අනතුරුව එම ඇගැයීම් දෙකෙහි ලකුණුවල එකතුව දෙකෙන් බෙදා ලැබෙන අගය දකුණු පස ඇති කොටුවෙහි ඇතුළත් කරන්න. දශම සංඛ්‍යාවක් ලැබෙන අවස්ථාවක දී එය ඊට ඉහළ ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයන්න.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020
පාසල් පාදක තක්සේරුකරණය යටතේ (50) නාට්‍ය හා රංග කලාව විෂයට අදාළ 11 ශ්‍රේණියේ
අවසාන තක්සේරුකරණය
සංක්ෂිප්ත ලකුණු සටහන් පත්‍රිකාව

විභාග අංකය :- ........................................

මණ්ඩල අංකය :.......................................

පරීක්ෂණ දිනය:..........................................

| අනු අංකය | විභාග අංකය | මුළු ලකුණු (100) | ක්‍රියාකාරකම A 1 ලකුණු 20 | ක්‍රියාකාරකම A 2 ලකුණු 20 | ක්‍රියාකාරකම B 1 ලකුණු 20 | ක්‍රියාකාරකම B 2 ලකුණු 20 | ක්‍රියාකාරකම B 3 ලකුණු 20 |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |
| 5 | | | | | | | |
| 6 | | | | | | | |
| 7 | | | | | | | |
| 8 | | | | | | | |
| 9 | | | | | | | |
| 10 | | | | | | | |
| 11 | | | | | | | |
| 12 | | | | | | | |
| 13 | | | | | | | |
| 14 | | | | | | | |
| 15 | | | | | | | |
| 16 | | | | | | | |
| 17 | | | | | | | |
| 18 | | | | | | | |
| 19 | | | | | | | |
| 20 | | | | | | | |

පරීක්ෂක 1 නම................................................ අත්සන..........................................

සංකේත අංකය ..........................................................

පරීක්ෂක 2 නම................................................ අත්සන..........................................

සංකේත අංකය ..........................................................

ප්‍රධාන පරීක්ෂකගේ නම................................................ අත්සන..........................................

සංකේත අංකය ..........................................................